# ආදි ආනන්දීය ඉංජිනේරු සංසදය
# ව්‍යවස්ථාව

## 01. නාමය

මෙම සංගමය ආදි ආනන්දීය ඉංජිනේරු සංසදය නමින් හැඳින්වේ. ඉංග්‍රීසි බසින් Old Anandian Engineers' Guild ලෙස හැඳින්වේ.

## 02. පරමාර්ථ

02.1 විද්‍යාලයේ සිසුන්ගේ ගණිත, පරිගණක සහ තාක්ෂණවේද දැනුම වැඩි දියුණු කිරීම.

02.2 තරුණ ආනන්දීයන්ට ඉංජිනේරු වෘත්තිය සඳහා මාර්ගෝපදේශන ලබාදීම.

02.3 පාසලේ සංවර්ධන සහ නඩත්තු කිරීමේ ව්‍යාපෘති සඳහා ඉංජිනේරුමය උපදෙස් සැපයීම.

02.4 ආදි ආනන්දීය ඉංජිනේරුවන් අතර සුහදතාවය වැඩි දියුණු කිරීම.

සහ

02.5 ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා සහය දැක්වීම.

## 03. අනුශාසකවරු

සංගමය වෙනුවෙන් අනුශාසකවරු පස්දෙනෙක් පත්වන්නේය. අනුශාසකවරුන්ගේ නිල කාලය වසර දෙකක් වන අතර මීළඟ වාර්ෂික මහා සභාවේදී නැවතත් එම තනතුර සඳහා පත්කරගත හැකිය.

03.1 තත් කාලයේ විද්‍යාලයාධිපතිතුමා නිල බලයෙන් එක් අනුශාසකවරයෙක් විය යුත්තේය.

03.2 තත් කාලයේ ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමා නිල බලයෙන් එක් අනුශාසකවරයෙක් විය යුත්තේය.

03.3 ආදි ආනන්දීය ඉංජිනේරු සංසදයේ හිටපු සභාපතිවරයකු යෝජනා ස්ථිරත්වයෙන් සංසදයේ අනුශාසක වරයෙකු ලෙස පත්කර ගත යුතු ය.
ආරම්භයේදී හිටපු සභාපතිවරයකු නොමැති බැවින් මෙම අනුශාසක වරයා ආරම්භක සාමාජිකයන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පත්කර ගනු ලැබේ

03.4 ඉංජිනේරු ක්ෂේත්‍රයට සුවිශේෂී මෙහෙවරක් සිදුකරන ලද ජ්‍යෙෂ්ඨ ආදි ආන්දීයයන් දෙදෙනෙක් විධායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් පත් කරගනු ලැබේ

## 04. සංගමයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම්

04.1 ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය් සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් තිබීම
සහ

04.2

04.2.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඇතුළත්වීමේ නිර්ණායක තීරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාලයක විද්‍යාවේදී (ඉංජිනේරු) උපාධියක් තිබීම (B. Sc (Engineering)) හෝ එම විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධි පාඨමාලාවක් හදාරන්නකු වීම.

හෝ

04.2.2 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (Institute of Engineers Sri Lanka) හි ආශ්‍රය සාමාජිකත්වය (Associate Member) ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

04.3 ඉංජිනේරු ක්ෂේත්‍රයට සුවිශේෂී මෙහෙයක් ඉටු කරන ලද ජ්‍යෝෂ්ඨ ආදි ආනන්දීයයන් හට සංගමයේ විධායක මණ්ඩලයේ අභිමතය පරිදි

04.4 සංගමයේ සාමාජිකත්වය ආකාර හතරකට පිරිනැමේ

04.4.1 සාමාජික - ඉහත සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් හට පිරිනැමේ. වාර්ෂික සාමාජික මුදලක් අයකෙරේ

04.4.2 යාවජීව සාමාජික - ඉහත සුදුසුකම් සපුරා ඇති වයස අවුරුදු 40ට වැඩි පුද්ගලයන් හෝ සංසදයේ සාමාජිකත්වය අඛණ්ඩව අවුරුදු දහයක් දරා ඇති පුද්ගලයන්. යාවජීව සාමාජිකත්වයට බඳවා ගැනීමේදී එකවර සාමාජික මුදලක් අයකෙරේ

04.4.3 ශිෂ්‍ය සාමාජික - ඉහත සුදුසුකම් සපුරා ඇති, දැනට ඉංජිනේරු උපාධි පාඨමාලාවක් හදාරන්නකු වීම

04.4.4 ගරු සාමාජික - ඉංජිනේරු ක්ෂේත්‍රයට සුවිශේෂී මෙහෙවරක් සිදු කරන ලද ජ්‍යෂ්ඨ ආදි ආනන්දීයන්හට විධායක මණ්ඩලයේ බහුතර කැමැත්ත මත යාවජීව සාමාජිකත්වය පිරිනැමෙනු ඇත.

# 05. සාමාජිකයන් බඳවා ගැනීම

05.1 සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට අනුව නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම් පතක් විධායක සභාවේ ඕනෑම සාමාජිකයකු වෙත ඉදිරිපත් කළ යුතුය.

05.2 සාමාජිකත්වය/ යාවජීව සාමාජිකත්වය සඳහා පාසැලින් අස්වීමේ සහතිකය හෝ ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජික කාඩ්පත, සහ උපාධි සහතිකය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වය සඳහා සුදුසුකම් සපුරාලන සහතිකය යන ලියවිලි වල පිටපත් ආකෘති පත්‍රය සමග ලබා දිය යුතුය.

05.3 ශිෂ්‍ය සාමාජිකත්වය සඳහා පාසැලින් අස්වීමේ සහතිකය හෝ ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජික කාඩ්පත, සහ විශ්ව විද්‍යාල හැඳුනුම්පත හෝ අදාළ පාඨමාලාවේ හැඳුනුම් පත යන ලියවිලි වල පිටපත් ආකෘති පත්‍රය සමග ලබා දිය යුතුය.

05.4 ප්‍රථම විධායක මණ්ඩලය පත්වීමෙන් පසු කෙරෙන බඳවා ගැනීමේදී ආකෘති පත්‍රය සාමාජිකයන් දෙදෙනෙකු විසින් නිර්දේශ කර තිබිය යුතුය.

05.5 එසේ ඉදිරිපත් කරන අයදුම්පත සඳහා සංගමයේ විධායක මණ්ඩලයේ අනුමැතියෙන් පසු සංගමයේ සාමාජිකත්වය හිමිවේ.

05.6 සාමාජික අයදුම් පත්‍රය සහ අනෙකුත් අදාළ සහතික ඉදිරිපත් කිරීම, අදාල සාමාජික ගාස්තු ගෙවීම ආදිය සංගමය විසින් නිවේදනය කරන පරිදි විද්‍යුත් උපයෝගිතා මගින් ද සිදුකළ හැකිය.

# 06. සාමාජික දායක මුදල

06.1 සාමාජික - වාර්ෂික දායක මුදල රු 2000/-

06.2 යාවජීව සාමාජික - රු 10,000/=

06.3 ශිෂ්‍ය සාමාජික - රු 500/= (ශිෂ්‍ය කාලපරිච්ඡේදයටම, උපරිම අවුරුදු 8)

06.4 ගරු සාමාජික - සාමාජික මුදලක් අය නොකෙරේ

06.5 සාමාජික මුදල විධායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් සංශෝධනය කළ හැක.

## 07. සාමාජිකත්වයෙන් ඉවත් කිරීම

චේතනාන්විතව සංගමයේ පරමාර්ථ වලට හානිකර අන්දමින් ක්‍රියා කර ඇති හෝ විද්‍යාලයේ හෝ සංගමයේ කීර්ති නාමයට හානිකර අන්දමින් ක්‍රියා කර ඇති හෝ එමෙන්ම රටේ පවත්නා නීතියට අනුව සාපරාධී (සුළු නොවන) වැරදි සඳහා වරද කරුවකු බවට නියම කෙරෙන තැනැත්තෙකු විධායක මණ්ඩලය විසින් ඒ පිළිබඳව පවත්වනු ලබන විනය පරීක්ෂණයකින් අනතුරුව විධායක මණ්ඩලයේ සාමාජිකයන්ගේ 2/3 බහුතරයකින් රහස් කැමැත්ත විමසීමක් මත සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැක. විනය පරීක්ෂණයේදී චෝදනාවට ලක්ව ඇති සාමාජිකයාට ඔහුට එරෙහිව ඇති චෝදනා දැක්විය යුතු අතර නිදහසට හේතු දැක්වීමේ අවස්ථාවද ලබාදිය යුතුය.

## 08. විධායක මණ්ඩලය

08.1 සභාපති

08.1.1 සභාපති තනතුර සඳහා ඉදිරිපත් වන පුද්ගලයන් අවම වශයෙන් එක් වරක්වත් උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරක් හොබවා තිබිය යුතුය. (ප්‍රථම විධායක මණ්ඩලය සඳහා මෙය අදාළ නොවේ)

08.1.2 කිසිදු සාමාජිකයකුට නොකඩවා දෙවරකට වැඩි වාර ගණනක් සභාපති තනතුර දැරිය නොහැකිය.

08.2 උප සභාපති වරු 3යි.

08.3 පසුගිය වාරයේ නිල කාලය අවසන් කළ සභාපති වරයා නිල බලයෙන් (ප්‍රථම විධායක මණ්ඩලය සඳහා මෙය අදාළ නොවේ).

08.4 සම ලේකම් තනතුරු 2යි.

08.5 උප ලේකම්

08.6 භාණ්ඩාගාරික

08.7 උප භාණ්ඩාගාරික

08.8 සංස්කාරක

08.9 සංවිධායක 03

08.10 කාරක සභික 12

සෑම ප්‍රධාන ඉංජිනේරු ක්ෂේත්‍රයක්ම නියෝජනය වන පරිදි නියෝජිතයන් නව දෙනෙක් පත්කර ගැනීමට දිරිමත් කෙරේ.

ශිෂ්‍ය සාමාජිකයන් අතරින් නියෝජිතයන් තිදෙනෙක් කාරක සභාවේ සාමාජිකයන් වන අතර ඔවුන් සියලුම ශිෂ්‍ය සාමාජිකයන් නියෝජනය කළ යුතුය.

ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු සඳහා ඉදිරිපත් වන සාමාජිකයන් අවම වශයෙන් එක් වරක්වත් විධායක මණ්ඩලය නියෝජනය කර තිබිය යුතුය.
(ප්‍රථම සහ දෙවන විධායක මණ්ඩල සඳහා ඉහත කොන්දේසි අදාළ නැත.)

## 09. විධායක මණ්ඩලය පත් කිරීම

09.1 විධායක මණ්ඩලය වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් බහුතර කැමැත්තෙන් පත්කරගත යුතු ය.

09.2 සභාපති වරයා ඇතුළු සියලුම විධායක සභිකයින්ගේ නිල කාලය වසර දෙකකි.

09.3 සංගමයේ සාමාජිකයන් හා යාවජීව සාමාජිකයන් පමණක් 8.1 සිට 8.10 තනතුරු සඳහා සුදුසුකම් ලබන්නේය.

09.4 ශිෂ්‍ය සාමාජිකයන් හැර අනෙකුත් සෑම වර්ගයකම සාමාජිකයන් හට ඡන්දය පාවිච්චි කිරීමේ බලය ඇත.

09.5 විධායක මණ්ඩලයේ සාමාජිකයන් එම නිලයන් සඳහා ඕනෑම වාර ගණනක් පත්කර ගත හැකිය.

09.6 වාර්ෂික මහා සභා රැස්වීමේදී විධායක මණ්ඩල තනතුරු සඳහා යෝජනා ස්ථිරත්වයෙන් අපේක්ෂකයන් බවට පත්වන සාමාජිකයන් එම සභාවේ රැඳී සිටය යුතුය. එසේ නොමැති විටකදී පිළිගත හැකි හේතුවක් සභාවට ලිඛිතව දැනුම් දී තිබිය යුතුය.

09.7 සියලුම විධායක මණ්ඩල සාමාජිකයන් තම ධූරයන් සිය කැමැත්තෙන්ම භාර ගත යුතුය.

## 10. විධායක මණ්ඩලයේ පුරප්පාඩු

10.1 සභාපති ධූරයෙහි පුරප්පාඩුවක් ඇතිවුවහොත් විධායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් උපසභාපති වරුන් අතරින් පත්කරගන්නා අයෙක් මීළඟ නිලවරණය දක්වා වන කාලය සඳහා සභාපති වරයා වන්නේය. එවන් අවස්ථාවකදී උප සභාපති ධූරයේ වැඩ බැලීමට සුදුසු විධායක මණ්ඩල සාමාජිකයකු විධායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් පත් කෙරෙනු ඇත. එවන් අවස්ථාවක හිස්වන විධායක මණ්ඩල තනතුර සඳහා කාරක සභාවේ සාමාජිකයන් අතරෙන් සුදුසු අයෙක් විධායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් පත් කෙරෙනු ඇත. මෙම පත්කිරීම් සියල්ල මීළඟ නිල වරණය තෙක් වලංගු වනු ඇත.

10.2 විධායක මණ්ඩලයේ ඕනෑම ධූරයක (සභාපති ධූරය හැර) පුරප්පාඩුවක් ඇති වුවහොත් මෙම ව්‍යවස්ථාවට අනුකූලව එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට විධායක මණ්ඩලයට බලය ඇත. මෙය විධායක මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් සිදු කෙරෙනු ඇත.

10.3 විධායක මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී අදාල තනතුර සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සපුරාලන සාමාජිකයන් ඒ සඳහා පත්කරගත යුතු වන්නේය.

## 11. වාර්ෂික මහා සභා රැස්වීම

11.1 විශේෂ අවස්ථාවන්හිදී හැර වාර්ෂික මහා සභා රැස්වීම එම වර්ෂයේ මාර්තු මාසයේ අවසන් දිනය ගතවීමට ප්‍රථම පැවැත්විය යුතුය. (මෙය ප්‍රථම මහා සභා රැස්වීමට අදාළ නොවේ)

11.2 එහි සනපූරණය 30 කි

11.3 වාර්ෂික මහා සභාව පැවැත්වෙන දිනය, ස්ථානය සහ වේලාව එහි න්‍යාය පත්‍රයේ අඩංගු විශේෂ කරුණු සමග එය පැවැත්වෙන දිනට දින 30 කට කළින් සෑම සාමාජිකයකුටම සම ලේකම් වරුන් විසින් ලිඛිතව හෝ තහවුරු කරන ලද විද්‍යුත් තැපෑලෙන් දැනුම් දිය යුතුය.

11.4 පසුගිය වාර්ෂික මහා සභාවේ වාර්තාව, වාර්ෂික ප්‍රගති වාර්තාව සහ සහතික කරන ලද වාර්ෂික විගණන වාර්තාව මෙහිදී ඉදිරිපත් කළ යුතුය.

11.5 ඉදිරි වර්ෂ දෙක සඳහා විධායක මණ්ඩලයක් පත් කරගැනීම එකක් හැර එකක් යෙදෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී සිදු කළයුතු වන්නේය.

11.6 සංගමයේ අයවැය විගණනය කිරීම වාර්ෂිකව සිදුකළ යුතු අතර මේ සඳහා වරලත් විගණකවරයකු පත්කර ගැනීමද වාර්ෂික මහා සභාවේ අනුමැතිය මත සිදුකළ යුතුය. මෙය එම නිල වසරක කාලය සඳහා කෙරෙන පත්කිරීමකි.

11.7 මීළඟ වර්ෂයේ අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමේදී භාණ්ඩාගාරික විසින් මෙම විගණන වාර්තාව ද ඉදිරිපත් කළ යුතුය.

11.8 වාර්ෂික මහා සභාවේදී සභාපති/ ලේකම් වරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා එයට පෙර පවත්වනු ලබන විධායක මණ්ඩල රැස්වීමේදී සම්මත කරගත් ඒවා විය යුතුය.

11.9 සභාපතිවරයා ගේ අවසරය සහිතව ව්‍යවස්ථානුකූලව නව යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව සාමාජිකයන් සතුවේ. ලිඛිතව එවැනි යෝජනා ඉදිරිපත් කිරීමට උනන්දුවන සාමාජිකයන් මහා සභා රැස්වීමට දින 7 කට කළින් ලැබෙන පරිදි ලේකම්වරයා වෙත ලැබීමට සැලැස්විය යුතුය.

## 12. විශේෂ මහා සභා රැස්වීම්

12.1 විධායක මණ්ඩලයේ වැඩි ඡන්දයෙන් සම්මතවූ යෝජනාවක් මගින් හෝ සාමාජිකයන් විසිපස් (25) දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් අත්සන් කරන ලද ඉල්ලීමක් සමලේකම් වරුන් වෙත භාරදීමෙන් හෝ සති 6ක් ඇතුළත විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය.

12.2 ලිඛිත ඉල්ලීමේ විශේෂ මහා සභා රැස්වීම කැඳවීමට ප්‍රස්තුත කාරණය පැහැදිලිව සඳහන් කළ යුතුය.

12.3 ඉහත සඳහන් අවස්ථාවන්හිදී එම රැස්වීම පැවැත්වෙන ස්ථානය, දිනය, වේලාව සහ විශේෂ මහා සභාව පැවැත්වීමේ අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කොට සාමාජිකයන් වෙත දින 14කට කළින් දැනුම් දිය යුතුය.

12.4 විශේෂ මහා සභා රැස්වීමේ සනපූරණය 30 කි.

## 13. විධායක මණ්ඩලය රැස්වීම

13.1 සෑම වර්ෂයකම අවම වශයෙන් වාර 8ක් වත් විධායක මණ්ඩලය රැස්විය යුතු අතර එම රැස්වීම සඳහා සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති යන අයගෙන් දෙදෙනෙකුවත් සහභාගිවීම අනිවර්ය වේ.

13.2 විධායක මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව දින 07 කට පෙර විධායක මණ්ඩලයේ සාමාජිකයින් වෙත දැනුම් දීම ලේකම්වරයාගේ යුතුකම වන්නේය.

13.3 විශේෂ අවස්ථාවකදී සභාපතිවරයාගේ තීරණය අනුව හෝ විධායක මණ්ඩලයේ සභිකයන් 10 දෙනෙකු විසින් සම ලේකම් වරුන්ගෙන් කෙනෙකු වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් අනුව හෝ විශේෂ විධායක මණ්ඩල රැස්වීමක් කැඳවිය හැකි අතර එම රැස්වීම දින 07 කට අඩු දැන්වීමකින් කැඳවිය හැකිය.

13.4 සියලු විධායක මණ්ඩල රැස්වීම්වල සනපූරණය 07 කි.

13.5 විධායක මණ්ඩලයේ ප්‍රථම රැස්වීමේදී එම වසර සඳහා විධායක මණ්ඩලයේ රැස්වීම් පවත්වන දින තීරණය කර ඒ සඳහා අනුමැතිය ලබා ගතයුතුය. එසේ අනුමත කරන ලද දින සඳහන් කරන ලද දින වක්‍රලේඛනයක් විධායක මණ්ඩලයේ සාමාජිකයින් වෙත ලිඛිතව ලබාදීම සමලේකම් වරුන්ගේ යුතුකම වන්නේය.

13.6 විධායක මණ්ඩල රැස්වීමේ මුලසුන සභාපතිවරයා විසින් දැරිය යුතුය. සභාපති වරයා සහභාගි නොවන අවස්ථාවක දී ඔහු විසින් නම් කරන ලද උපසභාපති වරයකු හෝ නැතහොත් එම සභාවට පැමිණ සිටින උප සභාපති වරයකු මුලසුන දැරිය යුතුය.

13.7 සංගමයේ කටයුතු වඩාත් සාර්ථකව ඉටු කිරීමේ අරමුණින් ස්වාධීන ස්ථාවර කමිටු පත්කිරීමේ බලය විධායක මණ්ඩලයට හිමිවන්නේය. මෙම කමිටුවල සභාපති ධුරය විධායක මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෙබවිය යුතුය. මෙම කමිටුවල කටයුතු කිරීම සඳහා විධායක මණ්ඩල සාමාජිකයින්ට අමතරව සංගමයේ සාමාජිකයින් අතරින් යම් අයෙකු පත්කිරීමේ බලය විධායක මණ්ඩලය සතුවන්නේය. එමෙන්ම ඕනෑම සාමාජිකයකු විධායක මණ්ඩල රැස්වීමට කැඳවීමේ බලය විධායක මණ්ඩලය සතුය.

13.8 විධායක මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට (3) පිළිගතහැකි හේතු දැක්වීමක් නොමැතිව සහභාගි නොවන සාමාජිකයන් විධායක මණ්ඩලයෙන් සිය කැමැත්තෙන් ඉවත් වූවන් ලෙස සැලකිය යුතුය. මෙම පුරප්පාඩු සඳහා අංක 10 ඡේදයට අනුව නව සාමාජිකයන් පත්කර ගතයුතුය. මෙසේ ඉවත් වූ සාමාජිකයන් හට ඒ බව දැන්වීමෙන් අනතුරුව දින 14ක් ඇතුළත සාධාරණ යැයි හැඟෙන හේතුවක් ඉදිරිපත් කොට ඇත්නම් නැවත විධායක මණ්ඩලයේ ඔහු දැරූ තනතුරේ පිහිටුවීමේ බලය විධායක මණ්ඩලයේ වැඩි සාමාජික කැමැත්ත මත සිදුකළ හැකිය.

13.9 මෙලෙසම මාස තුනකට (03) හෝ ඊට වැඩි කාලයකට සංගමයේ කටයුතු වලට සහභාගි වන්නට නොහැකි තත්ත්වයකට මුහුණ දෙන විධායක මණ්ඩල සාමාජිකයන් ඒ බව විධායක මණ්ඩලයට දන්වා සිය කැමැත්තෙන් විධායක මණ්ඩලයෙන් ඉවත්වීම තම යුතුකම වන්නේය.

# 14. ඡන්ද පාවිච්චිය

14.1 ශිෂ්‍ය සාමාජිකයන් හැර සෑම වර්ගයකම සාමාජිකයන් හට ඡන්දය පාවිච්චි කිරීමේ බලය ඇත.

14.2 ඕනෑම වාර්ෂික, විශේෂ මහා සභා සහ විධායක මණ්ඩල රැස්වීම්වලදී මුලසුන හොබවන තැනැත්තාට සාමාජිකයකු වශයෙන් තමන්ට හිමි ඡන්දයට අමතරව පාවිච්චි කළ හැකි තීරක ඡන්දයක් ඇත.

# 15. වගකීම

15.1 සංගමයේ පරිපාලනය පිළිබඳ සම්පූර්ණ වගකීම විධායක මණ්ඩලය සතුය.

15.2 රැස්වීම්වල වාර්තා නිසි පරිදි ලේකම් ලේඛන ගත කළ යුතුය. සාමාජික ලේඛනයක් ද පවත්වාගෙන යා යුතුය.

15.3 සෑම රැස්වීමක වාර්තාවක්ම ඉන්පසු පැවැත්වෙන ප්‍රථම රැස්වීමේදී සභාවට ඉදිරිපත් කර සම්මත කරගත යුතුය. එයට සැලකියයුතු බාධාවක් ඇතිවූ කල්හි පමණක් ඊළඟ රැස්වීමේදී ඉදිරිපත් කොට සම්මත කරගැනීමේ අයිතිය විධායක මණ්ඩලය සතුවේ. විධායක මණ්ඩලයේ සාමාජිකයන්ගේ වගකීම් එක් එක් ඡේදය යටතේ දක්වා ඇත.

# 16. පාලනය

16.1 සංගමයේ සාමාන්‍ය පාලන කටයුතු විධායක මණ්ඩලය සතුය.

# 17. භාණ්ඩාගාරික සතු කාර්යභාරය හා සංගමයේ මුදල් පාලනය

17.1 සංගමයට අයවිය යුතු සියලුම මුදල් එකතුකර නිසි පරිදි විධායක මණ්ඩලය අනුමත කරනලද බැංකු ගිණුමක/ ගිණුම්වල තැන්පත් කළ යුතුය.

17.2 විධායක මණ්ඩලයේ අනුමැතිය පරිදි සංගමයේ මුදල් පරිහරණය කිරීමේ වගකීම පැවරේ.

17.3

(අ) සංගමයේ මුදල්/ අරමුදල් බැංකුවක/ බැංකුවල සහ වෙනත් මූල්‍ය ආයතනවල තැන්පත් කිරීම හෝ සුදුසු පරිදි ආයෝජනයක යෙදවීම විධායක මණ්ඩලයේ අනුමැතිය අනුව සිදුවිය යුතුය.

(ආ) සියලුම ගිණුම් හා ආයෝජන සංගමයේ නාමයෙන් හෝ විධායක මණ්ඩලයේ තීරණයට අනුව කරන නාමයකින් පවත්වාගෙන යා යුතුය. මෙම ගිණුම් හෝ ආයෝජනයන් ඉවත්කර ගැනීම හෝ විකිණීම සඳහා විධායක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

17.4

(අ) විශේෂ හා නිශ්චිත කාර්යයන් සඳහා විධායක මණ්ඩලය විසින් අනුමත කරන නාමයකින් බැංකු ගිණුම් පවත්වාගෙන යා හැකිය.

(ආ) යම් ව්‍යාපෘතියක් හෝ වෙනත් විශේෂ කරුණක් සඳහා අරමුදලක් පවත්වාගෙන යන්නේනම් එම මුදල වැය කළ හැකකේ නියමිත ව්‍යාපෘතියට හා එම ව්‍යාපෘතියට අදාළ සම්මතයන්ට අනුකූලව පමණි. යම් ව්‍යාපෘතියක් අවසානයේදී ඉතිරිවන මුදල් විධායක මණ්ඩලයේ අනුමැතිය ඇතිව සංගමයේ අරමුදලට බැර කළ හැකිය.

17.5

(අ) සියලු චෙක්පත් හා බැංකු කටයුතු සඳහා පහත දැක්වෙන තනතුරු හොබවන දෙදෙනෙකුගේ අත්සනින් යුක්තවිය යුතුය. හැකි සෑම අවස්ථාවකදීම භාණ්ඩාගාරික එලෙස අත්සන් කිරීම යෝග්‍ය වේ.

1. සභාපති
2. සම ලේකම්
3. භාණ්ඩාගාරික
4. උප සභාපති
5. උප භාණ්ඩාගාරික
6. උප ලේකම්

(ආ) මෙම ව්‍යවස්ථාවේ 17.5 ඡේදයේ සඳහන් විධායක මණ්ඩලයේ සාමාජිකයකු/ සාමාජිකයන් තම ධූරවලින් ඉවත් වුවහොත් සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික හෝ ඒ බව අලුතින් පත්වූ තැනැත්තා/ තැනැත්තන්ගේ නම හා අත්සන ද එම පත්වීම කළ සභා වාර්තාවේ පිටපතක් ද සහිතව බැංකුවට/ බැංකුවලට/ අදාළ ආයතන වලට දැනුම් දිය යුතුය.

17.6 සංගමයේ මුදල් වර්ෂය සෑම වසරකම ජනවාරි පළමුවෙනිදා (01)යින් ආරම්භව එම වසරේම දෙසැම්බර් තිස් එක්වෙනිදා (31) යින් අවසන් වේ.

17.7 පිළිගත් ගිණුම් ක්‍රමවලට අනුව සංගමයේ අය-වැය වාර්තා හා බිල්පත් වාර්තා පවත්වාගෙන යා යුතු අතර එම වාර්තා විගණක හා විධායක මණ්ඩලයේ නියමයන් හා ඉල්ලීම පරිදි ඉදිරිපත් කළ යුතුය. සෑම විධායක රැස්වීමකදීම සභා අයවැය වාර්තාවක් විධායක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. සෑම විශේෂ ව්‍යාපෘතියකටම ඉහත නියමයන්ට අනුව වෙනම වාර්තා පවත්වා ගත යුතුය.

17.8 ගිණුම් වාර්තා තැබීමේදී ඒවා නිවැරදිව ඉටුවී ඇත්දැයි සංගමයේ විගණක ලවා පරීක්ෂා කරගත යුතුය.

17.9 ගිණුම් වාර්තා නිසියාකාරව පවත්වාගෙන යන්නේද යන්න සොයා බැලීම ගණන් තැබීමට උදව් කිරීම අභ්‍යන්තර ගණන් පරීක්ෂකගේ යුතුකම වන්නේය. අභ්‍යන්තර ගණන් පරීක්ෂක විධායක මණ්ඩලය විසින් පත්කර ගතයුතුය.

17.10 වාර්ෂික මහා සභා රැස්වීමේදී භාණ්ඩාගාරික විසින් අය-වැය ඉදිරිපත් කළයුතුය. අය වැය වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීමට පෙර පවත්වනු ලබන විධායක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කොට සම්මත කරගෙන ඉන් අනතුරුව මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාවේ පිටපතක් පැමිණ සිටින සෑම සාමාජිකයකුටම ලබාදිය යුතුය.

# 18. ව්‍යවස්ථා සංශෝධන

18.1 ව්‍යවස්ථා සංශෝධන කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන යෝජනා, යෝජනාකරු හා ස්ථිරකරු ඇතුළු අවම වශයෙන් ශිෂ්‍ය නොවන සාමාජිකයන් විසි පස් (25) දෙනෙකුගේ අත්සන් සහිතව හෝ විධායක මණ්ඩලයේ වැඩි ඡන්දයෙන් ලැබූ අනුමැතිය සහිතව හෝ ඉදිරිපත් කළ යුතුය.

18.2 මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වී ඇති අවස්ථාවකදී වාර්ෂික මහා සභාව පැවැත්වීමට මාස තුනකට වඩා වැඩි කාලයක් ඉතිරි වී ඇත්නම් විධායක මණ්ඩලය විසින් එම ව්‍යවස්ථා සංශෝධනය සලකා බැලීම සඳහා විශේෂ මහා සභා රැස්වීමක් එම යෝජනාව විධායක මණ්ඩලයට ඉදිරිපත් වූ දින සිට දින 45 ක් ඇතුලත පැවැත්විය යුතුය.

18.3 ව්‍යවස්ථා සංශෝධන කිරීමට ඉදිරිපත් කෙරෙන යෝජනා නියමිත රැස්වීමට දින 14 කට පෙර සියලු සාමාජිකයන්ට ලිඛිතව දැනුම්දිය යුතුය.

18.4 ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලබන යෝජනා නොවැම්බර් මස 30 වන දිනට පෙර සංගමයේ ලේකම් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

18.5 ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන යෝජනා, වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හෝ පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක (2/3) වැඩි ඡන්දයෙන් පමණක් සම්මතවේ. ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකරන මහා සභාවේ සනපූරණය 75ක් වේ.

# 19. අර්ථ නිරූපණය

19.1 මෙම ව්‍යවස්ථා මාලාවේ සංගමය යනු ආදි ආනන්දීය ඉංජිනේරු සංසදයයි.

19.2 විද්‍යාලය යනු කොළඹ 10, පී. ද එස්. කුලරත්න මාවතේ පිහිටි කොළඹ ආනන්ද විද්‍යාලය වන්නේය.

19.3 සාමාජික යනු සංගමයේ හෝ විධායන මණ්ඩලයේ විය හැකිය.

19.4 වසරක් යනු සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වූ දින සිට එළඹෙන වසරේ ඊළඟ මහා සභා රැස්වීම දක්වා වූ කාලය යි.

19.5 මෙම ව්‍යවස්ථාවේ ඇති ඕනෑම වගන්තියක් පිළිබඳව හෝ ව්‍යවස්ථාවේ සඳහන් නොවන කාරණයක් සඳහා හෝ අර්ථ නිරූපනය පිළිබඳවත් ඕනෑම ප්‍රශ්නයක් පිළිබඳවත් විධායක මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වනු ඇත.

19.6 මෙම සංගමය මෙහි සඳහන්වන පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා පමණක් ආනන්ද විද්‍යාලය තුළ කටයුතු කරනු ඇත.